// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2342/05 – 2023 ජූලි 24 වැනි සඳුදා – 2023.07.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2021/09.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.09.30 දිනැති හා අංක 2299/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හොරණ, පෝරුවදණ්ඩ, රත්මල්ගොඩ, මැදගේට්ටුව පාර, අංක 442/18 හි පදිංචි කේ.ජී.කේ.සේනාරත්න මයා සහ කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609 හි පිහිටි ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 39960 – 20 (2023/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

බේරුම්කාර නීතිඥ : අචාර්ය පාලිත සේනාධීර මැතිතුමා ඉදිරියේ දී ය.
ගොනු අංක : IR/COM/01/2021/09.
*නඩු අංකය:* ඒ/55/2022.

කේ.ජී.කේ. සේනාරත්න,
442/18, මැදගේවිටුව පාර,
රත්මල්ගොඩ,
පෝරුවදණ්ඩ
හොරණ.

*පළමු පාර්ශ්වය*

**සහ**
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
නො. 609,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ - 09.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

ඉහත පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා ආමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 දරන හා 1957 අංක 62 සහ 1962 අංක 4 දරන හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) 1950 දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙකී ආරාවුල නිරාකරණය කිරීම සඳහා මා පත් කොට ඇත.

**යොමුව :-**

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2022.09.14 දිනැති යොමුව ලෙස කේ.ජී.කේ. සේනාරත්න මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව වසරක සේවා කාලයක් අහිමි කිරීම එම සේවා කාලය සඳහා වැටුප් හා සියළු දීමනා අහිමි කිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.

පළමු පාර්ශ්වය 2007.08.14 දින සිට මුතුරාජවෙල තාර අලෙවි හා ගබඩා සංකීර්ණයේ සේවයේ යෙදී සිටින අතරතුර 2018.12.04 වන දින පළමු වන පාර්ශ්වය විනය විරෝධී කටයුතු කොට චෝදනා ලබා එකී විනය කමිටුව විසින් විමර්ෂණය කොට 1,2,3 චෝදනා වලින් නිදහස් කොට 4,5 චෝදනා සඳහා වැරදිකරු කොට 2020.02.13 වන දින නැවත සේවය පිහිටුවා ඇත. මෙහි දී විසඳිය යුතු ප්‍රශ්නය වන්නේ 2018.12.04 වන දින නවතා දැමූ හිඟ වැටුප සහ දීමනා පළමු වන පාර්ශ්වයට හිමිවේද යන්න සහ එසේ හිමිවිය යුතු නම් එකී හිඟ වැටුප සහ දීමනා ගෙවිය යුතු ද යන්නයි.

මෙහි දී ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිටි අතර වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මානව සම්පත් නිලධාරි හසිත සෙනවිරත්න මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරි ජනිත් පීරිස් මහතා සමගින් නීතිඥ මලීෂා පැස්කුවෙල් මිය පෙනී සිටී.

**ආරාවුලේ පසුබිම :-**

ඉල්ලුම්කාර පළමු වන පාර්ශ්වය 2007.08.14 වන දින ආරක්ෂක නිලධාරියෙකු ලෙස පත්වීම ලබා ඇත. 2018.12.04 වන දින රාත්‍රි කාලයේ අධික ලෙස බීමත්ව සිටි බවට චෝදනා ලබා ඇත. 2019.05.14 වන දින මේ සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කොට ඇත. විනය පරීක්ෂණ කමිටුව විසින් මෙකී චෝදනා 5 විමර්ෂණය කොට 1,2,3 චෝදනා සඳහා ඉල්ලුම්කරු නිදහස් කොට ඇති අතර 4,5 චෝදනා සඳහා ඉල්ලුම්කරු වැරදිකරු කොට ඇත. පාලන අධිකාරිය විසින් 2020.12.04 වන දින යලි ඉල්ලුම්කරු සේවයේ පිහිටුවා ඇත. ඉල්ලුම්කරු මෙම කාර්මික අධිකරණයෙන් අයඳ සිටින්නේ 2018.12.09 දින සිට 2019.05 14 දින දක්වා කාලය තුළ හිඟ වැටුප් සහ දීමනා ලබා දෙන ලෙසයි.

**ප්‍රදානය ලබා දීමේ දී හේතු වී ඇති කරුණු :-**

ආර් - 1 දරන ලේඛනය පත්වීමේ ලිපිය ලෙස ලකුණු කොට ඇත. එකී ලිපිය මගින් ඉල්ලුම්කරු සේවයේ පිහිටු වූ බවට සනාථ වේ. ආර්- 2 ලිපිය මගින් වැඩ තහනම් වූ බවට දෙපාර්ශ්වයම පිළිගනී. ආර් - 2(බී) යන්නෙන් වගඋත්තරකරු ලකුණු කළ කොටස මගින් අදාළ ඉල්ලුම්කරුට වැටුප් නොගෙවීමට තිරණය කොට ඇත්තේ සහකාර මානව කළමණාකාරතැන වේ. ආර් - 4 ලේඛනය මගින් ඔප්පු වන්නේ ඉල්ලුම්කරු 1,2,3 චෝදනාවලින් නිදහස් කොට ඇති අතර 4, 5 චෝදනාවලට වැරදිකරු කොට ඇති බවයි. එම ආර් - 4 දරන ලේඛනය මගින් නැවත ඉල්ලුම්කරු සේවයට කැඳවා ඇත. ආර් - 4(බී) දරන සලකුණු කරන ලද කොටස මගින් වැටුප් නොගෙවන බවට තීරණය කර ඇත්තේ මානව සම්පත් කළමණාකාරතැන බව මනා ලෙස ඔප්පු වේ. ආර් - 9(ඒ) ලෙස සලකුණු කරන ලද කොටස මගින් හිඟ වැටුප් රහිතව ඉල්ලුම්කරු නැවත සේවයට කැඳවා ඇත. ඉල්ලුම්කාර පක්ෂයට ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍රයේ 4, 5 චෝදනාවලට වරදකරු වී ඇත. 4 චෝදනාව වන්නේ සංස්ථාවේ ගෞරවය කෙලෙසු බවය. 5 වන චෝදනාව වන්නේ සංස්ථාවේ විශ්වාසය කඩවන ආකාරයෙන් ක්‍රියා කළ බවයි. මේ අනුව සාක්ෂි ආඥාපනතේ ප්‍රතිපාදන මත 1,2,3 යන චෝදනා ඔප්පු නොකොට 4,5 දරන චෝදනා ඔප්පු වන්නේ කෙසේ ද යන මූලික නීති මූල ධර්මය විනය කමිටුව මගින් කඩ කොට ඇත. මේ අනුව විනය කමිටුවේ තීන්දුව සිද්ධිමය සහ නීතිමය කරුණු වරදවා වටහා ගෙන නිකුත් කරන ලද නියෝගයකි.

මෙම ප්‍රදානය නිකුත් කිරීමේ දී ආර් - 7 ලේඛනය ඉතා වැදගත් වේ. එහි විනය කමිටුව නිර්දේශ කොට ඇත්තේ සේනාරත්න යන අය බීමතින් සිටි බවට ඔප්පු කිරීමට අභිචෝදකයා අසමත් බවයි. එහෙත් 4, 5 චෝදනාවලට වරදකරු කොට ඇත. 4, 5 චෝදනාවලට වරදකරු කිරීමට කිසිදු නීතිමය හෝ සිද්ධිමය පසුබිමක් විනය කමිටුවට ඉදිරිපත් වී නොමැත. එකී විනය කමිටුවේ නිර්දේශවල ඉල්ලුම්කරු වැටුප් සහ දීමනා රහිතව සේවයේ යෙදවීමට නිර්දේශ කොට ඇත. ශ්‍රී ලංකා නීති පද්ධතියේ මූලික නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3.5 ඡේදයෙන් දැක්වෙන්නේ ඕනෑම පුද්ගලයෙක් වරදකරු කරන තෙක් ඔහු නිර්දෝශී පුද්ගලයෙකු වන බවයි. ඒ අනුව ඉල්ලුම්කරු 1, 2, 3 චෝදනාවලට නිර්දෝශී වන බැවින් 4.5 චෝදනාවලට ද නිර්දෝශී විය යුතුය. ආර්- 7 දරන ලේඛනය මගින් ඉල්ලුම්කරු සේවයේ පිහිටුවා ඇති අතර ආර් - 4(බී) දරන වගඋත්තරකරු ලකුණු කළ කොටසින් දැක්වෙන්නේ මානව සම්පත් කළමණාකරනතැන සේවය තහනම් කළ කාලයේ වැටුප් නොගෙවීම පදනම් කොට ගෙන ඇත්තේ ඉහත කී විනය පරීක්ෂණය වේ. පාලන අධිකාරිය විනය පරීක්ෂණය පවත්වා ඇති ආකාරයත් ඉන් පසුව ඉල්ලුම්කරු කෙරෙහි දක්වා ඇති කාර්ය පටිපාටියත් අයුක්ති සහගත සහ අසාධාරණ බව නිගමනය කරමි. තවද 2018.12.04 වන දින සිට 2020.02.06 වන දින කාලය දක්වා අදාළ හිඟ වැටුප් සහ දීමනා නොගෙවීම නිසා ඉල්ලුම්කරුට ආසාධාරණයක් සිදු වී ඇති බව නිගමනය කරමි.

**ප්‍රදානය :-**

මේ අනුව 2018.12.04 දින සිට 2020.02.06 දින දක්වා කාලය වෙනුවෙන් වැටුප් ගෙවිය යුතු බව නිගමනය කරමි. R18 ලේඛනය අනුව ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු.56,270/-ක් බව පැහැදිලි වේ. 2018.12.07 සිට 2020.02.06 දක්වා කාලය තුල වැටුප් නොගෙවා ඇති කාලය මාස 14ක් බව පැහැදිලි වේ. ඒ අනුව රු.56,270 ක් බැගින් මාස 14ක කාලයක් සඳහා රු.787,780/- ක මුදලක් ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවට නියෝග කරමි. එකී මුදල ගැසට් ගත කිරීමෙන් පසු මසක් ඇතුලත සහකාර කම්කරු කොමසාරිස් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත තැන්පත් කරන ලෙස නියෝග කර සිටිමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

ආචාර්ය පාලිත සේනාධීර
බේරුම්කරු ;

2023 ජුනි මස 21 වැනි දින.

EOG 07 - 0220

*මගේ අංකය*: IR/COM/03/2017/238.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.11.09 දිනැති හා අංක 2148/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගාල්ල, බෝපේ,එගොඩ කනත්ත, අංක 118/එන්/19 හි පදිංචි පී. කේ. අජන්ත මයා සහ ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය

**බේරුම්කරු :- කේ.කේ.කේ. ධනපාල මැතිණිය ඉදිරියේදී ය.**
ගොනු අංක : IR/COM/03/2017/238.
*නඩු අංකය:* ඒ/111/2019.

පී. කේ. අජන්ත මයා,
අංක 118/N/19
එගොඩ කනත්ත,
බෝපේ,
ගාල්ල, *පළමු පාර්ශ්වය*

**සහ**

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක. 19,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

පෙනී සිටීම

| | | |
|---|---|---|
| පළමු පාර්ශ්වය වෙනුවෙන් | - | ග්‍රේෂන් සිල්වා නියෝජිත මහතා |
| දෙවන පාර්ශ්වය වෙනුවෙන් | - | නීතිඥ ඔෂිනි සේනාධිපති මහත්මිය ද, ආයතනය නියෝජනය කරමින් සහකාර කළමනාකරණ නිලධාරිනී ශාන්ති චන්ද්‍රානි ජයවර්ධන මහත්මිය. |

**ප්‍රදානය**

**බලතල පැවරීම.**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හිටපු අමාත්‍ය රවින්ද්‍ර සමරවීර විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත් කර මා වෙත යොමු කර ඇත.

**එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ.**

පී.කේ. අජන්ත යන අයගේ 2015.04.02 වන දිනට නියමිත වැටුප් වර්ධකය, සේවා යෝජක වන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්හිටුවීම සහ හෝ විලම්භනය කිරීම යුත්ති සහගත ද? එසේ නොවන්නේ නම්, හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

**ආරාවුලට අදාළ පසුබිම.**

පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වීය ආයතනයේ 1999.04.02 වන දින සිට කාර්මික නිලධාරී තනතුරේ සේවය කර ඇත. එම තනතුර දරමින් සිටින අතරතුර දෙවන පාර්ශවීය ආයතනයට අයත් කාර්යාලයන් තුනක සේවය කර ඇත. එනම් 2014.04.02 වන දින සිට 2014.05.05 දින දක්වා බද්දේගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ද, 2014.05.06 වන දින සිට 2015.03.05 වන දින දක්වා තිස්සමහාරාම ඉංජිනේරු කාර්යාලයේ ද, 2015.03.06 වන දින සිට 2015.04.01 වන දින දක්වා ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ද, සේවය කර ඇත.

එනම් එකම අවුරුද්දක් තුල මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වයට අයත් කාර්යාල තුනක සේවය කර ඇති අතර වැටුප් වර්ධක ලබා දීමේදී සේවකයාගේ සමීපතම අධීක්ෂණ නිළධාරියා විසින් අදාළ සේවකයා රාජකාරී නිසිලෙස ඉටුකළ බවට නිර්දේශයක් ලබාදිය යුතු අතර එම නිර්දේශය පළමු පාර්ශ්වය සේවය කළ කාර්යාල තුනෙන් සමීපතම අධීක්ෂණ නිළධාරීන් තිදෙනා විසින් මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය නිසි ලෙස තම රාජකාරී ඉටු නොකිරීම හා පළමු පාර්ශවයේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහීමකට පත් විය නොහැකි බැවින් මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයට අදාළ වැටුප් වර්ධක ගෙවීම නිරදේශ කර නොමැත.

මේ සම්බන්ධයෙන් මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය ගාල්ල කම්කරු කාර්යාලයේ පැමිණිල්ලක් ගොනු කිරීමෙන් අනතුරුව එය විසඳා ගැනීමට නොහැකිවීම මත මෙම ආරාවුල කොළඹ කම්කරු දෙපාර්තමේන්තුවටද යොමුකර එමගින්ද විසදාගැනීමට නොහැකි වීම මත බේරුම්කිරීම මගින් විසඳා ගැනීම සඳහා යොමු කර ඇත.

**සාක්ෂි විශ්ලේෂණය.**

මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය දෙවන පාර්ශවීය ආයතනය මගින් 1999.04.02 වන දින සිට කාර්මික නිලධාරී තනතුරට බඳවාගෙන තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සේවයට අනුයුක්ත කර ඇත.ප්‍රශ්නයට තුඩු දී ඇති කරුණ සම්බන්ධයෙන් සලකා බැලීමේදී මෙලෙස අනුයුක්ත කලද, වරින් වර සේවා ස්ථාන කිහිපයක ස්ථාන මාරු ලැබීමෙන් අනතුරුව සේවය කර ඇති බව මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වයේ සාක්ෂි මගින් තහවුරු වන අතර එනම් 2014.04.02 වන දින සිට 2014.05.05 දින දක්වා බද්දේගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ද, 2014.05.06 වන දින සිට 2015.03.05 වන දින දක්වා තිස්සමහාරාම ඉංජිනේරු කාර්යාලයේ ද, 2015.03.06 වන දින සිට 2015.04.01 වන දින දක්වා ගාල්ල ඉංජිනේරු කාර්යාලයේ ද, නමුත් ඒ කිසිදු අවස්ථාවක පළමු වන පාර්ශ්වය, තමාව ද්වේශ සහගතව ස්ථාන මාරු වීම් කළ බවට වාචික සාක්ෂි මගින් හෝ ලේඛනමය සාක්ෂි මගින් තහවුරු කිරීමක් කර නැති අතර දෙවන පාර්ශ්වීය ආයතනය මගින් ද, මෙම ස්ථාන මාරුවීම් වලට හේතුව සාක්ෂි මගින් කිසිදු අවස්ථාවක තහවුරු කර නැත.එබැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු හබයක් දෙපාර්ශ්වය අතර නොමැති බවට නිගමනය කරමි.

මෙම ආරාවුලට අදාළව ප්‍රධාන වශයෙන් ප්‍රශ්න ගත වී ඇති කරුණ වන්නේ වැටුප් වර්ධකය ලබා ගැනීමට අවශ්‍ය නිර්නායක සම්පූර්ණ කර ගැනීමට මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට දෙවන පාර්ශ්වය නිසි රාජකාරිමය පහසුකම් ලබා දී නොමැති බවයි.

නමුත් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය, පළමු පාර්ශ්වයේම මූලික ප්‍රශ්න මගින් තහවුරු කර ඇත්තේ A3 දරන ලේඛනය මගින් රාජකාරී පැවරීමක් තමාට කල බවය. නමුත් දෙවන පාර්ශ්වය එම ලේඛනයම R7 ලෙස ලකුණු කරමින් මෙම ආරවුලේ පළමු පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න මගින් එම ලේඛනය තමාට ලැබී ඇති බවට විමසන අවස්ථාවේ එම ලේඛනය මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට ලැබී නොමැති බවට පළමු පාර්ශ්වය තරයේම ප්‍රකාශ කර ඇත.නමුත් A3 (දෙවන පාර්ශ්වය එම ලේඛනයද R7 ලෙස ලකුණු කර ඇත.) දරන

ලේඛනය මත මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය තම අත්සනද යොදු එම රාජකාරි පැවරීම බාරගෙන ඇත. ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය විනිශ්චය සභාවද නොමග යන අයුරින් පරස්පර විරෝධී මෙන්ම තමාම අත්සන යොදා පිළිගත් ලේඛනයම එක් අවස්ථාවක පිළිගෙන තවත් අවස්ථාවකදී එම තමාට නොලැබී ඇති බවට තරයේම ප්‍රකාශ කර සාක්ෂි ලබා දී ඇත.එබැවින් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය තමාට රාජකාරි පැවරීමක් දෙවන පාර්ශ්වීය ආයතනය මගින් සිදු නොකල බවට ගෙන ඇති ස්ථාවරය එමගින් බිඳ වැටේ.

තවද මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය තමාට නිසි ලෙස ලිඛිතව රාජකාරි පැවරීමක් නොකල බැවින් තම රාජකාරිය නිසි ලෙස ඉටු කිරීමට නොහැකි වූ බව දිගින් දිගටම සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ A5 දරන ලේඛනය මගින් නිසි ලිඛිත රාජකාරි පැවරීමක් R7දරන ලේඛනය මගින් කර නොමැති බවය. නමුත් ලේඛන දෙකම එකම ආකාරයෙන් රාජකාරි පැවරීමක් බවට දෙවන පාර්ශ්වීය ආයතනය මගින් හරස් ප්‍රශ්න විමසා සිටී. විට එම R7දරන ලේඛනය මගින් නිසි රාජකාරි පැවරීමක් කර නොමැති බවට පාර්ශ්වය විසින් සාක්ෂි ලබා දී ඇත.

නමුත් එම ලේඛන දෙක වෙන වෙනම විමර්ශනශීලීව පරීක්ෂා කළ විට තහවුරු වන්නේ එම ලේඛන දෙක මගින් රාජකාරි දෙකක් එකම ආකාරයෙන් පවරා ඇති බවත්, රාජකාරි පැවරීම කල තිස්ස ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දෙදෙනා පමණක් වෙනස් වී ඇති බවකි. එබැවින් මෙම සියලු ලේඛනමය හා වාචිකමය සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය දිගින් දිගටම තමාට රාජකාරි පැවරීම නිසි ලෙස ඉටු නොකල බවට අසත්‍ය හා විනිශ්චය සභාව නොමග යන අයුරින් සාක්ෂි ලබා දී ඇති බවය.එබැවින් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට නිසි ලෙස රාජකාරි පැවරීම ලිඛිතව පැවරීමක් කර ඇති බවට R7දරන ලේඛනය මගින් තහවුරු වේ.

තවද R7 දරන ලේඛනය මගින් තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් ලේඛනයේ දක්වා ඇති මාර්ගවල නඩත්තු කටයුතු, අධීක්ෂණ කටයුතු මෙන්ම වැඩිදියුණු කටයුතුද, අවශ්‍යතාවය මත ඇස්තමේන්තු සැකසීම ද මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට පවරා ඇත.නමුත් ඒ සම්බන්ධයෙන් ගත් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය ගත් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් ලේඛනමය හෝ වාචිකමය සාක්ෂි මගින් තහවුරු වී නොමැත.

තවද මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය A1.A2 දරන ලේඛන මගින් සාක්ෂි ලබා දෙමින් දිගින් දිගටම ප්‍රකාශ කර ඇත්තේ තමාට අවශ්‍ය උපදෙස් ලිඛිතව හා රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් ද ලබා නොදුන් බවයි. ඒ බව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය සාක්ෂි ලබා දෙන අවස්ථාවේ විනිශ්චය සභාවේ දී සලකුණු කර ඉදිරිපත් කරන ලද A1.A2 දරන ලේඛන මගින් තහවුරු වුව ද, එම A1 දරන ලේඛනය හා බැඳෙන 2014.05.19 දරන ලිපිය කුමක්ද යන්න විනිශ්චය සභාවට ඉදිරිපත් කර නොමැත. තවද A2 දරන ලේඛනයෙන් ඉල්ලා ඇති පහසුකම් ලබා දීමට කුමන පාරවල් පරීක්ෂා කිරීමටද යන්නවත් එම ලිපියේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය සඳහන් කර නොමැත.මෙලෙස ඉල්ලීම් කර ඇත්තේ මෙම ආරවුලේ පළමු පාර්ශ්වය තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සේවය කරමින් සිටින අවස්ථාවේ දී බව A1 ,A2 දරන ලේඛන මගින් තහවුරු කිරීමට උත්සහ දරා ඇත.

එමෙන්ම R5 ,R13 හා R14 දරන ලේඛන මගින් මෙම ආරවුලේ පළමු පාර්ශ්වය වෙත දෙවන පාර්ශ්වය යොමු කර ඇති අනෙක් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් නගා ඇති චෝදනා සම්බන්ධයෙන් එයට එරෙහිව පළමු පාර්ශ්වය කිසිදු ලේඛනමය හෝ වාචිකමය සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති අතර හරස් ප්‍රශ්නවලදී එම ස්ථාවරය බිඳහෙලීමටද පළමු පාර්ශ්වය අපොහොසත් වී ඇත.

තවද මෙම ආරවුලේ පළමු පාර්ශ්වය තමාට ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් හා ගමන් වියදම් ලබා නොදුන් බවට සාක්ෂි ලබා දෙමින් තම ස්ථාවරය තහවුරු කිරීමට කටයුතු කළද, මෙම ආරවුලේ පළමු පාර්ශ්වය මගින් දෙවන පාර්ශ්වය සලකුනු කර විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද R11 හා R12 දරන ලේඛන මගින් තමාට යතුරු පැදියක් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ලබා දීඇති බව පිළිගෙන ඇත.

අදාළ රාජකාරි කටයුතු සඳහා දැරීමට සිදුවන ප්‍රවාහන වියදම් නැවත දෙවන පාර්ශ්වීය ආයතනයෙන් ලබා ගැනීමට හැකි බවද මෙම ආරවුලේ පළමු පාර්ශ්වය සාක්ෂි ලබා දීමේදී පිළිගෙන ඇත.

මෙම ඉහත සඳහන් සියලු සාක්ෂි විමසා බැලීමෙන් අනතුරුව තහවුරු වන්නේ මෙම ආරවුලේ පළමු පාර්ශ්වයට රාජකාරි නිසිලෙස පවරා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියා මාර්ගයක් පළමු පාර්ශ්වය ගෙන නොමැති බවත්, තවද ක්ෂේත්‍ර රාජකාරි සඳහා යතුරු පැදියක් ලබා දී ඇති බවත්, ක්ෂේත්‍ර රාජකාරි සඳහා ප්‍රවාහන වියදම් දෙවන පාර්ශ්වීය ආයතනයෙන් ලබා ගැනීමට හැකියාව ඇති බවත්ය.

ඉන් අනතුරුව විසඳාගත යුතු ගැටලුව වන්නේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය තමනට පවරන ලද රාජකාරි ඉටු කිරීම පැහැර හැරීම් නිසා මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට 2015.04.02 දිනට නියමිත වැටුප් වර්ධක ලබා දීම නිර්දේශ කිරීම මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට ආසන්නතම නිලධාරීන් ප්‍රත්ක්ෂේප කිරීමය.

වැටුප් වර්ධකයක් යනු සේවකයකු විසින් උපයා ගත යුතු දෙයක් මිස එය සාක්ෂි විමසීමකින් ලබා දිය හැකි දෙයක් නොවන අතර තවද වැටුප් වර්ධකය අයිතිවාසිකමක් වශයෙන් ලබා ගැනීමට හිමිකමක් ද නොමැත. එය සේවකයා විසින් තම රාජකාරි කටයුතු කාර්යක්ෂමවත් අනලස්වත් ඉටු කිරීමෙන් හා වැටුප් වර්ධක කාල සීමාව තුල මුලුමනින්ම සේවය කිරීම මගින් සේවකයා එම වැටුප් වර්ධකය උපයා ගත යුතුය.

මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය සේවය කල සේවා ස්ථාන තුන වන පිළිවෙලින් බද්දේගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල යන සියලුම ඉංජිනේරු කාර්යාල මගින් වැටුප් වර්ධක නිර්දේශ කිරීම අපහසු බව දන්වා ඇති බව දෙවන පාර්ශ්වීය ආයතනය මගින් මෙම ආරාවුල විභාග වන අවස්ථාවේ සලකුණු කර ඉදිරිපත් කර ඇති R5 ,R13,R15 දරන ලේඛනමය සාක්ෂි මගින් තහවුරු වේ.

තවද මෙම වැටුප් වර්ධක නිර්ණායක වලදී දක්වූ දුර්වලතා හේතු කොට ගෙන 2015.04.02 වන දිනට හිමි වැටුප් වර්ධක අත්හිටුවීමට තීරණය කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු කිසිවක් ඇත්නම් දින 7 ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසද, R3 ලේඛනයෙන් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයට ආයතනය විසින් දන්වූ බව පළමු පාර්ශ්වය පිළිගෙන ඇත. තවද මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය උක්ත කරුණට අදාළ නිදහසට කරුණු දක්වීමක් R2 දරන ලේඛනය මගින් කල බවත්, ඒ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් කළ බවත් එයට මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය සහභාගි වූ බවද පිළිගෙන ඇත.එම කරුණු දක්වීමේදී කිසිදු අකාරයකින් මෙම ආරවුලේ පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදු වූ බවට සාක්ෂියක් පළමු පාර්ශ්වය ලබා දී නොමැත. එම පරීක්ෂණයෙන් පසුව දෙවන පාර්ශවීය ආයතනය මගින් ගෙන ඇති නිගමනය අනුව R16 දරන ලේඛනය මගින් මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය වෙත දන්වා එවා ඇත්තේ පළමු පාර්ශ්වයට 2015 වර්ෂයට හිමි වැටුප් වර්ධක විලම්භනය කරන බවය.

ඒ අනුව මෙම සියලු සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව තහවුරු වන්නේ රාජකාරි නිසි ලෙස පළමු පාර්ශ්වයට පැවරුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවය.

තවද R3 දරන ලේඛනය මගින් පළමු පාර්ශ්වය වෙත රාජකාරි පැවරීම පළමු පාර්ශ්වය විසින් පිළිගෙන පසුව එම ලේඛනයම R7 ලෙස දෙවන පාර්ශ්වය ලකුණු කරන අවස්ථාවේ එලෙස රාජකාරි පැවරීමක් නොකළ බවට පරස්පර විරෝධී මෙන්ම විනිශ්චය සභාව සාක්ෂි පිළිබඳව තබන ලද විශ්වාසනීයත්වය බිඳහෙලන ආකාරයෙන් සාක්ෂි ලබා දී ඇත.

තවද ක්ෂේත්‍ර කටයුතු සඳහාද යතුරු පැදියක්ද, අදාළ ගමන් වියදම් පියවා ගැනීමේ ක්‍රමවේදයක්ද තිබූ බව මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය පිළිගෙන ඇත.

වැටුප් වර්ධක අත්හිටුවීමෙන් අනතුරුව නිදහසට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දී ඇත. තවද ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක්ද සිදු කර ඇත.එම පරීක්ෂණයේදී කිසිදු අවස්ථාවක තමාට අසාධාරණයක් වූ බවට මෙම ආරාවුලේ පළමු පාර්ශ්වය සාක්ෂි ලබා දී නොමැති අතර තවද දෙපාර්ශ්වයෙන් කිසිදු පාර්ශ්වයක් අදාළ පරීක්ෂණ වාර්තා මෙම විනිශ්චය සභාවට ඉදිරිපත් කිරීමටද කටයුතු කර නොමැත.එබැවින් එම අවස්ථාවේ යම් අසාධාරණයක් මෙම ආරවුලේ පළමු පාර්ශ්වයට සිදු වී ඇතිද යන්න පිළිබඳව සලකා බැලීමට හැකියාවක් නැත.

එබැවින් වැටුප් වර්ධක අත්හිටුවීම දෙවන පාර්ශ්වීය ආයතනය මගින් සිදු කරන ලද ද්වේශ සහගත ක්‍රියාවක් නොවන අතර වැටුප් වර්ධක සෑම විටම සේවකයා විසින් උපයා ගත යුතු දෙයක් මිස ආයතනය විසින් ලබා දීමට බැඳී සිටින දෙයක් නොවේ. තවද මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වය ට 2016 හා 2017 යන වර්ෂ වෙනුවෙන් වැටුප් වර්ධක උපයාගෙන ඇති බැවින් එම වර්ෂය සඳහා අදාළ වැටුප් වර්ධක ලබා දීමට ද දෙවන පාර්ශ්වීය ආයතනය කටයුතු කර ඇත.

එබැවින් සියලු ඉදිරිපත් වූ වාචිකමය හා ලේඛනමය සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව මෙම වැටුප් වර්ධක විලම්භනය කිරීම ද්වේෂ සහගතව හා අසාධාරණ අන්දමින් සිදුකර ඇති බවට කිසිදු ආකාරයකින් තහවුරු නොවන බැවින්, පළමු පාර්ශ්වයට අදාළව ඉල්ලා ඇති කිසිදු සහනයක් ලබා දීමට ප්‍රදානයක් ලබා නොදෙමි.ඒ අනුව මෙය යුක්ති සහගත හා සාධාරණ ප්‍රදානයක් බවට තීරණය කරමි.

**කේ.කුමුදු කුමාරි ධනපාල,**
බේරුම්කරු.

2023 ජුනි මස 15 වැනි දින.

EOG 07 - 0221